## උපායශීලි නගර සංවර්ධන ව්‍යාපෘතිය - 2015

උපායශීලි නගර සංවර්ධන ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2014 සැප්තැම්බර් 12 දින එළඹි අංක 5428 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ 11 (ආ) 3 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

### 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, එවකට නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ සහභාගීත්ව නගර කලාපවල තෝරාගත් නාගරික සේවා සහ පොදු නාගරික ස්ථාන වැඩිදියුණු කිරීමයි. ඒ අනුව ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කළ යුතු සහභාගීත්ව නගර කලාප ලෙස මහනුවර නගරය හා ගාල්ල නගරය තෝරා ගෙන තිබුණි. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 25,162.48 කට සමාන විගැහි (SDR) මිලියන 95 (එජඩො මිලියන 192.08) ක් වූ අතර ඉන් රු.මිලියන 19,257 කට සමාන එජඩො මිලියන 147 ක් සැපයීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 මැයි 05 දින ආරම්භ කරන ලද අතර 2019 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට නියමිතය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.4 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.
මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් ව්‍යාපෘතිය විසින් දරන ලද වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව හා 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි ද යන බව.

(ඊ) ණය යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(උ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඌ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනා ගෙන තිබුණේද යන බව.

(එ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඒ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ

(ඔ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගත වන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැර මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) මූල්‍ය ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට නාගරික සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු රු.939,744 ක මුදලක් ජංගම බැරකම් යටතේ දක්වනු වෙනුවට ව්‍යාපෘති අරමුදල් ගිණුම යටතේ දක්වා තිබුණි.

(ආ) පෙර වර්ෂයේ රු.මිලියන 16.39 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කරන ලද පිරියත, දේපල හා උපකරණ සඳහා ක්ෂය ප්‍රතිපාදනය කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2015 දෙසැම්බර් 31 දිනට පිරියත, දේපල හා උපකරණ සඳහා ක්ෂය ප්‍රතිපාදනය රු.මිලියන 1.77 කින් අඩුවෙන් දක්වා තිබුණි.

### 2.2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ 2007 අගෝස්තු 07 දිනැති අංක ඊආර්ඩී/2007/2 දරන චක්‍රලේඛය මඟින් නිකුත් කරන ලද උපදෙස් අනුව, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන ඊළඟ වර්ෂයේ මාර්තු 31 ට හෝ ඊට පෙර විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2016 මැයි 02 දින දීය.

(ආ) ව්‍යාපෘති ඇගයීම් ලියවිල්ලේ 24 ඡේදය පරිදි ව්‍යාපෘතිය විසින් පිළියෙල කළ යුතු ප්‍රසම්පාදන පරිපාලන අත්පොතක් 2015 දෙසැම්බර් 31 වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 2.2.3 ප්‍රදාන අරමුදල් ඌනපූරණය කිරීමේදී ගැටලු

ලැබුණු තොරතුරු අනුව, ව්‍යාපෘතිය විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වා ගෙන යනු ලබන විශේෂ ඩොලර් ගිණුමේ 2015 ජනවාරි 01 දිනට රු.මිලියන 871.83 කට සමාන එජඩො මිලියන 6.65 ක ශේෂයක් පැවතුණි. ඊට අමතරව, 2015 ජුනි 10 දින රු.මිලියන 503.25 කට සමාන එජඩො මිලියන 03 ක අග්‍රිම ලබා දී තිබූ අතර ඉන් රු.මිලියන 475.92 කට සමාන එජඩො 3.48 ක් සමාලෝචිත වර්ෂය තුළ ආපසු ලබාගෙන තිබුණි. එබැවින් ව්‍යාපෘතියේ කාර්යයන් සඳහා මූල්‍ය අවශ්‍යතාවයන් පිළිබඳ දුර්වල පුරෝකථනය හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 888.68 කට සමාන එජඩො මිලියන 6.16 ක් විශේෂ ඩොලර් ගිණුමේ අතිරික්තව පැවතුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළ හා 2015 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍ය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දින දක්වා | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ජාසංසං | 147.00 | 19,257.00 | 3,450.00 | 2.78 | 367.99 | 2.93 | 387.29 |
| ශ්‍රී ලං ර | 45.08 | 5,905.48 | 960.00 | 0.69 | 91.02 | 1.01 | 132.94 |
| එකතුව | 192.08 | 25,162.48 | 4,410.00 | 3.47 | 459.01 | 3.94 | 520.23 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමස්ත ව්‍යාපෘති කාලපරිච්ඡේදය ආවරණය වන පරිදි මාසික, කාර්තුමය හා අර්ධ වාර්ෂික ආදී වශයෙන් මූල්‍ය හා භෞතික ඉලක්ක ඉස්මතුකර දක්වමින් නිශ්චිත ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළ ඉලක්ක සපුරා ගැනීම සඳහා වගකීම් පවරමින් පරිපූර්ණ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් තිබිය යුතු වුවත් එවැනි සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) තවද ව්‍යාපෘති ඇගයීම් ලියවිල්ලේ II ඡේදය පරිදි ව්‍යාපෘතියේ වැඩ සැලැස්ම පදනම් කරගෙන සමාලෝචිත වර්ෂය සඳහා විස්තරාත්මක අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා රජයේ අයවැය ඇස්තමේන්තුවේ කරන ලද රු.මිලියන 4,410 ක වෙන් කිරීමෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 459.01 ක මුදලක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ඇ) ඉහත තොරතුරු අනුව, ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් වෙන්කරන ලද රු.මිලියන 19,257 කට සමාන එජඩො මිලියන 147 ක මුළු අරමුදල්වලින්, ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීමේ දින සිට වර්ෂ 02 ක් ඉකුත් වූ පසු 2015 දෙසැම්බර් 31 දිනට මුළු වෙන්කිරීමෙන් සියයට 02 ක් නියෝජනය වන රු.මිලියන 387.29 කට සමාන එජඩො මිලියන 2.93 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

### 3.2 භෞතික ප්‍රගතිය

මහනුවර හා ගාල්ල නගරවල තෝරාගත් නාගරික සේවා සහ පොදු නාගරික ස්ථාන වැඩි දියුණු කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කිරීමට ව්‍යාපෘතිය කටයුතු කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව රැස්වීම් 06 ක් හා ව්‍යාපෘති උපදේශක කමිටුව රැස්වීම් 04 ක් සමාලෝචිත වර්ෂය තුළ පවත්වා තිබුණු බව නිරීක්ෂණය විය. කෙසේ වුවද අදාළ මහ නගර සභා, මාර්ග සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නියෝජිතයන් ඉහත සඳහන් කමිටුවලට ස්ථිර පදනම මත පත්කර නොතිබුණි. එබැවින් ඉහත සඳහන් නියෝජිතායතන අතර වගකීම් බෙදාහැරීම මඟින් ව්‍යාපෘතියේ මෙහෙයුම් පහසු කරගැනීම සඳහා කමිටු රැස්වීම්වලදී ඵලදායී තීරණයන් ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) වර්ෂ 2 ක කාලයක් තුළ නිම කිරීමට සැලසුම් කර තිබූ ගාල්ල නගරයේ ප්‍රධාන ඇල මාර්ගවල හා කාණු පද්ධතියේ අලුත්වැඩියා වැඩ 2016 අප්‍රේල් 30 දින වන විටත් ආරම්භ කර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂය තුළ ආරම්භ කිරීමට සැලසුම් කර තිබූ මාර්ග 03 ක් පුනරුත්ථාපනය කිරීම, කොටු පවුර තුළ ඇවිදින මාර්ගවල ඉදිකිරීම් වැඩ, ගාල්ල මහනගර සභා ප්‍රදේශයේ වෙනත් යටිතල පහසුකම්වල වැඩිදියුණු කිරීම් වැඩ 2016 අප්‍රේල් 30 වන විටත් ආරම්භ කර නොතිබුණි. ගාල්ල නගරයේ ප්‍රතිසංස්කරණ කළ යුතු පාලම් 05 ක් අතුරින් සමගිවත්ත, කනම්පිටිය හා බෙලිගහ පාලම් 03 ක ප්‍රතිසංස්කරණ වැඩ සමාලෝචිත වර්ෂය අවසානයේ සියයට 50 කින් නිම කිරීම සඳහා අපේක්ෂා කර තිබුණද සාමාන්‍යයෙන් සියයට 07 ක පහල ප්‍රගතියක් දක්වා තිබුණි.

(ඇ) "ආතර් සීට් වීව්න් ඩෙක්" (Arthur's Seat Viewing Deck) හි පුනරුත්ථාපන වැඩ සහ මහනුවර නගර ප්‍රදේශයේ ජල සම්පාදන පද්ධතිය සැලසුම් කිරීම සහ ඉදිකිරීම, අධීක්ෂණය, විශාලනය හා පුනරුත්ථාපන කාර්යයන් 2015 දෙසැම්බර් 31 දින නිම කිරීමට සැලසුම් කර තිබුණද එදිනට පිළිවෙලින් සියයට 40 ක හා සියයට 85 ක මන්දගාමී ප්‍රගතියක් වාර්තා කර තිබුණි.

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.මිලියන 373.80 ක පිරිවැයකට මහනුවර නගරයේ සංවර්ධන වැඩ පිළිබඳ ඉදිකිරීම් හා උපදේශක කොන්ත්‍රාත්තු 04 ක් සඳහා ලංසු විවෘත කිරීමේ හා ගිවිසුම්වලට එළඹීමේ ක්‍රියාවලිය මාස 03 සිට මාස 06 ක් දක්වා ප්‍රමාදයන් සහිතව ක්‍රියාත්මක කර තිබුණි. ඊට අමතරව, රු.මිලියන 163.82 ක පිරිවැයකට පිරිනමන ලද ගාල්ල නගරයේ සංවර්ධන වැඩ සඳහා ඉදිකිරීම් හා උපදේශක සේවා කොන්ත්‍රාත් 03 ක් මාස 03 ක ප්‍රමාදයක් සහිතව ක්‍රියාත්මක කර තිබුණි. තවද මහනුවර නගරයේ ඉඩම් 03 ක් අත්පත් කරගැනීම සඳහා මැනීම් කටයුතු හා ලුවී පිරිස් මාවතෙහි උද්‍යාන අලංකරණ කටයුතු පිළිවෙලින් මාස 06 ක හා මාස 08 ක ප්‍රමාදයන් සහිතව නිම කර තිබුණි. ගාල්ල

නගරයේ පාලම් සඳහා ජාතික ජාලය ස්ථාපිත කිරීමට අදාළ වැඩ නිම කිරීම සඳහා සැලසුම් කර තිබූ දිනයේ සිට මාස 13 ක ප්‍රමාදයක් සහිතව එම වැඩ නිමකර තිබුණි.

(ආ) මහනුවර නගරයේ භූගත ජල ටැංකි 03 ක ඉදිකිරීම් වැඩ පිළිබඳ විගණකවරුන් විසින් කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණයේ දී, 2015 මාර්තු 13 දින රු.මිලියන 13.40 ක් වටිනා වානේ බාර් ටොන් 67 ක් ඉදිකිරීම් වැඩ සඳහා අවශ්‍ය ප්‍රමාණයට වැඩියෙන් ප්‍රසම්පාදනය කර තිබූ බව අනාවරණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස අනවශ්‍ය ලෙස පිරිවැය මත රු.මිලියන 2.68 ක වැඩ පූර්ව අත්තිකාරම් කොන්ත්‍රාත්කරුට වැඩියෙන් ගෙවා තිබුණි. ඉහත සඳහන් ඉදිකිරීම් වැඩ සඳහා කොන්ත්‍රාත්කරු විසින් කරන ලද අංක 01 දරන ඉල්ලීම් බිල්පත යටතේ ප්‍රමාණ පත්‍ර විෂයයන් 09 ක් සඳහා රු.මිලියන 1.2 ක මුදලක් වැඩිපුර ගෙවා තිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය.

## 3.4 මතභේදයට තුඩුදෙන කරුණු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා දෙකකදී කොළඹ සිට යාපනය දක්වා ගුවන් ගමන් සඳහා ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු දායකයෙන් රු.209,000 ක මුදලක් වැයකර තිබුණි. කෙසේ වුවද ගුවනින් යාමේ අවශ්‍යතාවය විගණනයට පැහැදිලි කර නොතිබුණි.

(ආ) ව්‍යාපෘති නියාමන ඒකකයේ අර්ධ කාලීන පදනම මත සේවය කරන ලද නිලධාරීන් 05 දෙනෙකුගේ පාරිශ්‍රමික ලෙස රු.700,920 ක මුදලක් ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු දායකයෙන් ගෙවා තිබුණි. කෙසේ වුවද ව්‍යාපෘතිය විසින් පවරන ලද වැඩ පැවරුම්වල ස්වභාවය තීරණය කිරීම සඳහා රාජකාරී වැඩ ලැයිස්තු හෝ යොමුගත කොන්දේසි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 3.5 අත්පත් කරගත් ඉඩම්වලට වන්දි ගෙවීම

රු.මිලියන 662 ක ඇස්තමේන්තුගත පිරිවැයකට ඉඩම් කැබලි 1,632 ක් අත්පත් කර ගැනීමට ව්‍යාපෘතිය විසින් සැලසුම් කර තිබූ අතර ඉන් ඉඩම් කැබලි 820 ක් සමාලෝචිත වර්ෂය අවසානයට අත්පත් කරගෙන තිබුණි. තවද ඉඩම් අත්පත් කරගැනීමේ කාර්යයන් සඳහා වැයකරන ලද රු.මිලියන 235 ක මුළු මුදලින් රු.මිලියන 188 ක මුදලක් අතිරේකව වන්දි ලෙස ගෙවා තිබුණි. ඉඩම් අත්පත් කරගැනීමේ සහ ප්‍රතිස්ථාපනය කිරීමේ නිර්දේශ යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක ඉඩම් කැබලි 14 ක් සඳහා රු.මිලියන 8.07 ක අතිරේක වන්දි ගෙවීම සඳහා හේතු සහ අත්පත් කරගත් ඉඩම්වල ප්‍රමාණය යනාදි විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 3.6 මානව සම්පත් කළමනාකරණය

2014 ජනවාරි 29 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීම් යෝජනා ක්‍රමයක් අනුමත කර තිබූ අතර ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු 16 කින් තනතුරු 8 ක් 2016 මැයි මාසය දක්වා පුරප්පාඩු වී පැවති බව නිරීක්ෂණය විය.

## 3.7 මූල්‍ය හා භෞතික පාලන ගැටලු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය විසින් ප්‍රසම්පාදනය කරන ලද දේපල, පිරියත හා උපකරණ ලේඛනගත කිරීම සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් විධිමත් පරිදි පවත්වා නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 134(3) හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2010 ජුලි 20 දිනැති අංක 05 දරන චක්‍රලේඛය ප්‍රකාරව ව්‍යාපෘතියේ ගනුදෙනු රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයේ විගණනයට භාජනය කර නොතිබුණි.